ISSN 2792-1468



**ප්‍රතිපත්ති සටහන**

# ස්වභාවික ආපදා රක්ෂණාවරණය

**භාෂා ප්‍රතිපත්තියේ අලසභාවය ජය ගැනීම දිවයින පුරා සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහායක් වනු ඇත**


## සාරාංශය

මෑත කාලයේ ශ්‍රී ලංකාව මුහුණ දුන් ස්වාභාවික ආපදා සංඛ්‍යාව අති විශාලය. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සු.ම.ක.) සතු මූල්‍ය සම්පත්වල හිඟකම ද, ආපදා හානි පූරණ ආයෝජන සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් හිඟකම ඒ හා බැඳී තිබීම ද නිසා සු.ම.ක. මෙවැනි ආපදාවලින් පීඩාවට පත් වීමේ වැඩි අවදානමකට ලක් වේ.

ශ්‍රී ලංකාවේ ආපදා රක්ෂණවල සීමාසහිත භාවිතාවට හේතු වන බොහෝ කරුණු ඇති අතර, ඒවායින් සමහරක් දැනටමත් හඳුනාගෙන සහ පුළුල්ව සාකච්ඡාවට ලක් කොට තිබේ. ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා රක්ෂණ ක්‍රියාවලිය තුළ සු.ම.ක. සහභාගීත්වය අඩු වීම පිළිබඳ මින් පෙර අවස්ථාවල සාකච්ඡාවට බඳුන්ව නොමැති, වෙරිටේ පර්යේෂණ ආයතනය විසින් සිදු කළ අධ්‍යයනයේදී මතු වූ සුවිශේෂ සොයාග ැනීමක් මෙම ප්‍රතිපත්ති සටහනෙන් ඉදිරිපත් කර ඇත.

1987 13 වන ව්‍යවස්ථා සංශෝධනය[1] ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන සියළුම පොදු සන්නිවේදනයන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පැවතිය යුතු බවට වන ප්‍රතිපත්තියකට රජය කැප වී සිටී. දැනට පවතින රක්ෂණයන් පිළිබඳ තොරතුරු සහ ලියකියවිලි මෙම භාෂා ප්‍රතිපත්තියට අනුකූල නොවීම ශ්‍රී ලංකාවේ ස්වභාවික ආපදා රක්ෂණයේ අඩු මට්ටමේ ආවරණයට කැපී පෙනෙන ලෙස දායක වී ඇති බව වෙරිටේ විසින් සොයා ගැනිණි.

කොළඹින් පිට ස්වාභාවික ආපදාවලට ලක් වූ ප්‍රදේශවල ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය 30%කට වඩා අඩු අගයක් ගනී. මහ කොළඹ ප්‍රදේශය තුළ පවා එම අගය ඇත්තේ 45%ක් පමණ සාමාන්‍යයක ය. කෙසේ වෙතත්, පෞද්ගලික රක්ෂණ ආයතන විසින් මෙන්ම රජය විසින් ලබා දෙන රක්ෂණාවරණ සුබසාධන යෝජනා ක්‍රම පිළිබඳවද තොරතුරු මුළුමනින්ම පාහේ පළ කරනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි සිංහල හා දෙමළ භාෂා කථාකරන ජනතාවට ස්වභාවික ආපදා රක්ෂණාවරණයේ ප්‍රතිලාභ ලබා ගැනීමට මෙම කරුණ මහත් බාධකයක් වී තිබේ.


## මූලික නිගමනයන්

### 1. ශ්‍රී ලංකාවේ ස්වභාවික ආපදා රක්ෂණාවරණ ආවරණය දුර්වල මට්ටමකින් සිදු කෙරෙන අතර, එය වඩා අධිකව බලපාන්නේ සු.ම.ක.වලට යි

- රක්ෂණ වාරික අගය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගෙන නිර්වචනය කර ඇති රක්ෂණ විනිවිදීමේ අනුපාතය, ආසියානු කලාපයේ සෙසු රටවල් බහුතරය සමඟ සසඳන කළ ශ්‍රී ලංකාවේ දී පහළ අගයක් ගනී.[2] සාමාන්‍ය හෙවත් ජීවිත රක්ෂණ නොවන රක්ෂණාවරණයේ උපවර්ගයක් වන ගිනි රක්ෂණය යටතේ එන ස්වභාවික ආපදා රක්ෂණයේ විනිවිදීම් අනුපාතය ඇත්තේ ඊටත් වඩා අඩු අගයක ය. ස්විස් රේ (Swiss Re) ආයතනයේ 2015 ගෝලීය රක්ෂණය පිළිබඳ සමාලෝචනයට අනුව ජීවිත රක්ෂණ නොවන රක්ෂණාවරණයන්ගේ විනිවිදීම් අනුපාතය ආසියාවේ 1.74 කි.[3] සන්සන්දනාත්මකව ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ නොවන රක්ෂණාවරණයන්ගේ විනිවිදීමේ අනුපාතය 0.66 ක් පමණි. එය ඉන්දියාව, වියට්නාමය, තායිලන්තය, මැලේසියාව වැනි ආසියානු කලාපයේ වෙනත් රටවලට මෙන්ම මොරොක්කෝව, කෙන්යාව, ටියුනීසියාව හා ඇන්ගෝලාව වැනි පහළ-මැදි ආදායම් ලබන රටවලට ද වඩා අඩු අනුපාතයකි.[4]
- ස්වාභාවික ආපදා රක්ෂණාවරණය ශ්‍රී ලංකාවේ බහුල ලෙස ඇත්තේ ප්‍රධාන කර්මාන්ත හා වාණිජ දේපළවලට ය. එබැවින්, සු.ම.ක. සඳහා ස්වාභාවික ආපදා රක්ෂණ විනිවිදීම් අනුපාතය බොහෝවිට ඊටත් වඩා අඩු වීමට ඉඩ තිබේ.

### 2. පුද්ගලික රක්ෂණ වෙළෙඳපළ භාෂා බාධකයෙන් අයුතු ප්‍රයෝජන ගනී.

- ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය රක්ෂණාවරණ සම්පාදකයින් අතරින් ඉහළම සම්පාදකයෝ 6 දෙනා, වෙළෙඳපළ පංගුවෙන් තුනෙන් දෙකකට හිමිකම් කියති. ගිනි රක්ෂණ ඔප්පු ලේඛන සිංහල බසින් ලබා දෙන්නේ ඔවුන් අතරින් එක් අයෙකු (වෙළෙඳපලින් 6%කට අඩුවෙන් හිමිකම් කියන) පමණි කිසිවෙකු මෙම ලේඛන දෙමළ භාෂාවෙන් ලබා දෙන්නේ නැත.
- 2017 මැයි මාසයේ දී රත්නපුර ප්‍රදේශයේ ඇති වූ ගංවතුරින් ආපදාවට ලක් වූ සු.ම.ක. හිමිකරුවෝ, තමන් විසින් පුද්ගලික රක්ෂණ සමාගම් නියෝජනය කළ රක්ෂණ නියෝජිතයින් හරහා ස්වාභාවික ආපදා රක්ෂණාවරණ ලබාගත්තේ යැයි සිතා සිටි බව අප සමඟ පැවසූහ. නමුත් ආපදාවන්ට පසු තම වන්දි ලබා ගැනීමට ගියවිට රක්ෂණාවරණ අලෙවි කළ නියෝජිතයින් තමන්ට වැරදි තොරතුරු ලබා දී ඇති බව ඔවුන්ට අවබෝධ වී තිබුණි. ඔවුන් අත්සන් කළ ලේඛන මුළුමනින්ම ඉංග්‍රීසි භාෂාවෙන් තිබූ බැවින්, නියෝජිතයින් විසින් සහතික කරන ලද කරුණු වැඩිදුර තහවුරු කර ගැනීමේ හැකියාවක් ඔවුන්ට නොතිබිණි.

## ප්‍රතිපත්ති සටහන

### 3. රජයේ රක්ෂණාවරණ සුබසාධක යෝජනා ක්‍රම ස්වභාෂාවන්ගෙන් සපයා නැත.

- ජාතික රක්ෂණ භාරකාර අරමුදලේ (ජා.ර.භා.අ.) පරිපාලනය යටතේ ඇති, රජයෙන් අරමුදල් ලබන ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ (ජා.ස්.ආ.ර.) යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු මෙම වසරේ මුල තෙක්ම තම වෙබ් අඩවිය තුළ සඳහන් කර තිබුණේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි. ජා.ස්.ආ.ර. ට අදාළ තොරතුරු 2017 නොවැම්බර් 13 දින වෙබ් අඩවිය පරීක්ෂා කරන විට පැවතියේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි. ජා.ස්.ආ.ර.ට අදාළ තොරතුරු සිංහල බසින් පළ කෙරුණේ 2018 මුල භාගයේ ය (මෙම සටහන ප්‍රකාශනයට පත්වන අවස්ථාවේ දී). තවමත් මෙම තොරතුරු දෙමළ බසින් පළ කර නැත.

- 2017 මැයි මාසයේ ගංවතුරෙන් ආපදාවන්ට ලක් වූ මාතර හා ගාල්ල දිස්ත්‍රික්කයේ සු.ම.ක. පිළිබඳ කළ සමීක්ෂණවල දී දැනගැනීමට ලැබුණේ ජා.ස්.ආ.ර. ක් පැවතීම ගැන පවා ඇත්තේ අඩු දැනුවත්කමක් බවයි. සාමාජිකයින් 5,385ක ගෙන් සමන්විත වූ ප්‍රජා සංවිධානයක් සමග සිදු කළ කේන්ද්‍රගත සාකච්ඡාවල දී ද වාර්තා වූයේ, ඔවුන් ද ජා.ස්.ආ.ර.ක් තිබේ යැයි දැනුවත්ව නොසිටි බවයි. යෝජනා ක්‍රමයට සම්බන්ධ තොරතුරු වෙත ස්වභාෂා ප්‍රවේශ පහසුකම නොතිබීම මෙම නොදැනුවත් බවට හේතු වන්නට ඇත.

### 4. බැංකු ක්ෂේත්‍රයේ දක්නට ඇති භාෂා නියාමනයන් රක්ෂණ ක්ෂේත්‍රය තුළ තවමත් පෙන්නුම් කර නොමැත.

- බැංකු නිෂ්පාදිත හෝ සේවාවලට අදාළ කොන්දේසි හා නියාමනයන් ගනුදෙනුකරුවන්ට තේරුම් ගත හැකි බවකින් ලබා ගත හැකි පරිදි තිබිය යුතු යැයි නිශ්චිතව දක්වමින් සියළුම බලපත්‍රලාභී බැංකුවලට විධානයක් පැනවීම හරහා බැංකු ක්ෂේත්‍රයේ රෙගුලාසි මගින් භාෂා ප්‍රතිපත්ති ගැටළුවට විසඳුමක් සපයා ඇත.

- ගනුදෙනුකරුවන්ට තේරුම් ගත හැකි ශ්‍රී ලාංකීය භාෂාවකින් රක්ෂණාවරණ ලේඛන ලබාදීම සමාග මිවලට නියම කරමින් පනවන ලද ඒ හා සමාන රෙගුලාසියක් රක්ෂණ කර්මාන්තය තුළ දක්නට නොමැත.

## ප්‍රකාශන සාරාංශය

### 1. ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික ආපදා රක්ෂණාවරණ සහභාගීත්වය - විශේෂයෙන්ම සු.ම.ක.වල - ඇත්තේ ඉතා අඩුවෙනි

ශ්‍රී ලංකාවේ සමස්ත ව්‍යාපාරවලින් 80% ක් වන සු.ම.ක. අතරින් 20% ක් කර්මාන්ත ස්ථාපිතයන් වන අතර 90% ක් සේවා අංශයට අයත් වේ.[5] තව ද, සු.ම.ක. දළ ජාතික නිෂ්පාදනයෙන් (ද.ජා.නි.) ආසන්න වශයෙන් 52% කට ද, රටේ සමස්ත සේවාදායකත්වයෙන් 45% කට ද දායකත්වය ලබා දේ.[6] ආර්ථිකයට හා සේවාදායකත්වයට සු.ම.ක. හි ඇති වැදගත්කම සලකන කළ. ව්‍යසනකාරී ස්වාභාවික ආපදාවකින් පසු කඩිනමින් ඔවුන්ව යථා තත්වයට පත් කිරීම සඳහා පහසුකම් සැපයීම තීරණාත්මක වේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සු.ම.ක.) සතු මූල්‍ය සම්පත්වල හිඟකම ද, එයටම ඇඳී ඇති ආපදා හානිපූරණ ආයෝජන හිඟකම සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් හිඟකම ද නිසා සු.ම.ක. මෙවැනි ආපදාවලින් පීඩාවට පත් වීමේ වැඩි අවදානමක පසු වේ.

ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික ආපදා පුද්ගලික රක්ෂණාවරණය පැතිරී ඇත්තේ අඩු සණත්වයකිනි. එය සාමාන්‍යයෙන් ප්‍රධාන කර්මාන්ත හා වාණිජ දේපළවලට සීමා වී තිබේ.[7] ශ්‍රී ලංකාවේ පුද්ගලික රක්ෂණ වෙළෙඳපළ දිගු කාලීන රක්ෂණ (ජීවිත රක්ෂණය) හා සාමාන්‍ය රක්ෂණය (ජීවිත නොවන රක්ෂණය) ලෙස පුළුල් ලෙස වර්ගීකරණය කළ හැකි වේ. ස්වාභාවික ආපදා රක්ෂණාවරණය, සාමාන්‍ය රක්ෂණයේ උප වර්ගයක් වන ගිනි හා අකුණු රක්ෂණවල දිගුවක් ලෙස පිරිනැමෙන්නකි. ශ්‍රී ලංකාව තුළ රක්ෂණ විනිවිදීම් මට්ටම (දළ ලිඛිත රක්ෂණ වාරික අගය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස) ආසියානු කලාපයේ අනෙකුත් රටවල් සමග සසඳන කළ අඩු අගයක පවතී.[8] ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ විනිවිදීම් මට්ටම 2015 සහ 2016 වසරවල පිළිවෙලින් 0.66ක් හා 0.67ක් විය. සංසන්දනාත්මකව 2015 දී ඉන්දියාව, වියට්නාමය, තායිලන්තය හා මැලේසියාවේ එය පිළිවෙළින් 0.72, 0.74, 1.79, හා 1.68, විය.[9] මොරොක්කෝව, කෙන්යාව, ටියුනීසියාව හා ඇංගෝලාව වැනි වෙනත් පහළ-මැදි ආදායම් රටවල් සියල්ලම 1.99, 1.88, 1.58, හා 0.8ක් වැනි ශ්‍රී ලංකාවට වඩා වැඩි සාමාන්‍ය රක්ෂණ විනිවිදීම් අනුපාතයක් වාර්තා කර තිබේ.[10]


1 වන ප්‍රදර්ශිතයෙන් පෙන්වා ඇති පරිදි, සාමාන්‍ය රක්ෂණයේ උප වර්ගයක් වන ගිනි රක්ෂණයට ශ්‍රී ලංකාව තුළ ඇත්තේ ඊටත් වඩා අඩු විනිවිදීම් අනුපාතයකි. ඒ අනුව, ගිනි රක්ෂණය යටතේ ඇති ස්වාභාවික ආපදා හෝ ස්වාභාවික ව්‍යසන රක්ෂණයේ සැබෑ අගය වඩාත් අඩු වීමට ඉඩ තිබේ. තව දල පුද්ගලික රක්ෂණය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ ප්‍රධාන කාර්මික හා වාණිජ දේපළ සඳහා වන බැවින්, සු.ම.ක.වල ආපදා රක්ෂණ විනිවිදීම විශේෂකොටම අඩු අගයක පැවතීමට ඉඩ තිබේ.

### 2. පුද්ගලික රක්ෂණ ආයතන භාෂා බාධාවෙන් අයුතු ප්‍රයෝජන ලබා ගනී

ස්වාභාවික ආපදා රක්ෂණය සම්පාදනයෙහි ලා බොහෝ බොහෝ දුර්වලතා දක්නට ඇතත්, ස්වාභාවික ආපදා රක්ෂණ වෙත ප්‍රවේශ වීමේ දී හා එහි ප්‍රතිලාභ ලබා ගැනීමේ දී, භාෂා බාධකය සු.ම.ක. මුහුණ දෙන එක් සුවිශේෂී බාධකයක් වී ඇති බව අපගේ පර්යේෂණය තුළින් අනාවරණය විය. ඕනෑම ගිවිසුමක් වෙත එලඹීමේ දී, එම ගිවිසුම ඵලදායී ලෙස ක්‍රියාවට නැංවෙන බව සහතික කර ගැනීමට නම්, එහි නියමයන් සහ කොන්දේසි සියළු පාර්ශවයන් විසින් අවබෝධ කර ගෙන තිබීම අවශ්‍ය වේ. එහෙත්, රක්ෂණ ඔප්පුවලට අදාළ නියමයන් සහ කොන්දේසි එම ඔප්පු ලේඛනවල සැමවිටම පාහේ සඳහන් වී ඇත්තේ ඉංග්‍රීසි බසින් පමණකි. එමෙන්ම, ඒවායේ අඩංගු තාක්ෂණික හා නෛතික යෙදුම් ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණත්වයක් ඇති

## ප්‍රතිපත්ති සටහන


1 වන ප්‍රදර්ශිතය : ශ්‍රී ලංකාවේ ගිනි රක්ෂණ විනිවිදීම් මට්ටම




*මූලාශ්‍රය : ශ්‍රී.ලං.ර.ම.යේ වාර්ෂික වාර්තා පදනම් කරගනිමින් කතුවරයා සිදු කළ ස්වකීය ගණනයන්*

*සටහන : ගිනි රක්ෂණ විනිවිදීම මැන බලන්නේ ගිනි රක්ෂණ ඔප්පුවලින් ලැබෙන ලිඛිත දළ වාරික අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසිනි*

2 වන ප්‍රදර්ශිතය : තෝරා ගත් දිස්ත්‍රික්කවල ඉංග්‍රීසි සාක්ෂරතා මට්ටම්




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා ජන හා නිවාස සංගණනය 2012*

*සටහන : ඉංග්‍රීසි සාක්ෂරතාව නිර්වචනය කරන්නේ ඉංග්‍රීසි කියවීමට හා ලිවීමට ඇති හැකියාව ලෙසිනි*

අයෙකුට පවා මුළුමනින්ම අවබෝධ කරගැනීමට දුෂ්කර ය. ශ්‍රී ලංකාවේ වයස අවු. 15 සහ ඉන් ඉහළ ජනගහණයේ ඉංග්‍රීසි භාෂා සාක්ෂරතා මට්ටම 30% ක් පමණක් වන පසුබිමක,[11] රක්ෂණ ලේඛනයක් හෝ වෙනත් කිසිදු ගිවිසුම් ලේඛනයක් ස්වභාෂාවෙන් ලබා නොදීමෙන්, එවන් සේවාවක් ගැන තක්සේරුවක් ලබා ගැනීමට මෙන්ම, ඒවා වෙත ප්‍රවේශ වීමට ද බාධා, විශේෂයෙන් ප්‍රාදේශීය මට්ටමෙන, ඇති කරයි.

2 වන ප්‍රදර්ශිතයෙන් පෙන්නුම් කරන්නේ 2016 වසරේ මැයි මාසයේ හා 2017 වසරේ ගංවතුරෙන් බරපතල ලෙස පීඩාවට පත් වූ දිස්ත්‍රික්ක 10ක වයස අවු. 15 හා ඊට වැඩි ජනගහනයේ ඉංග්‍රීසි සාක්ෂරතා මට්ටමයි. බස්නාහිර පළාතෙන් පිටත ප්‍රදේශවල ඉංග්‍රීසි සාක්ෂරතා මට්ටම සැලකිය යුතු ලෙස අඩු ය. රක්ෂණ නියෝජිතයින් විසින් ප්‍රාදේශීය හා ග්‍රාමීය ව්‍යාපාර වලින් අයුතු වාසි ලබා ගැනීමේ අවදානමක් ඇති බව මෙම දත්ත හෙළිදරව් කරයි. සාමාන්‍යයෙන් මෙම නියෝජිතයින් රක්ෂණ සමාගම්වල සෘජු සේවකයින් නොවේ. ඔවුන්ගේ වැටුප පදනම් වන්නේ එක් රැස් කර ගන්නා වාරික එකතුව මත සහ අළුතෙන් එක් කර ගන්නා ඔප්පු සංඛ්‍යාව මත බැවින් හැකි තරම් ප්‍රමාණයක් රක්ෂණ ඔප්පු අලෙවි කිරීමට ඔවුන් දිරි ගැන්වී ඇත.

2017 මැයි මාසයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුරෙන් පීඩාවට පත් වූ සු.ම.ක. හිමිකරුවන් විසින් රක්ෂණ නියෝජිතයින් හරහා ස්වාභාවික ආපදා පුද්ගලික රක්ෂණාවරණ ලබා ගෙන, ඉන් පසුව කිසිදු වන්දියක් ලබා ගැනීමට නොහැකි වීම ගැන ඔවුන් සමඟ අප පැවැත්වූ සාකච්ඡාවලින් හෙළිදරව් විය.[12] මෙම සු.ම.ක. හිමිකරුවන්ට ලැබුණු ඔප්පුවල නියමයන් හා කොන්දේසි ලියවී තිබුණේ ඉංග්‍රීසි බසිනි. ඔවුන් පවසන පරිදි, තම රක්ෂණාවරණවල ගංවතුර ආවරණය ද ඇතුළත් වී ඇති බව රක්ෂණ ගිවිසුම්වලට එළැඹෙන අවස්ථාවේ දී රක්ෂණ නියෝජිතයින් විසින් පවසනු ලැබ තිබිණි. තම රක්ෂණාවරණවල ගංවතුර හානි ආවරණයක් නොවූ බව තමන් දැන ගත්තේ, ගංවතුරෙන් ඉක්බිතිව වන්දි ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ පසුව පමණක් බව ඔවුන් පැවසී ය.

තෝරා ගත් රක්ෂණ සමාගම්වල ගිනි රක්ෂණ ඔප්පු ලේඛන භාෂා තුනෙන්ම ලබා ගත හැකි ද යන වග 3වන ප්‍රදර්ශිතයෙන් පෙන්නුම් කෙරේ. මෙම එක් එක් රක්ෂණ සමාගම් වෙත දුරකථන ඇමතුම් ලබා දී ගිනි රක්ෂණ ඔප්පු ලේඛන භාෂා තුනෙන්ම ලබා ගත හැකි දැයි විමසා බැලිනි. එම ලේඛන පහසුවෙන්ම ඉංග්‍රීසි බසින් ලබා ගත හැකි බව සියළු සමාගම් දන්වා සිටියහ. ලේඛන සිංහල බසින් ද ලබා ගත හැකිව තිබුණේ පීපල්ස් රක්ෂණ සමාගම වෙතින් පමණි.


### 3. රජයේ රක්ෂණ යෝජනා ක්‍රම ස්වභාෂාවන්ගෙන් සපයා නැත

පුද්ගලික රක්ෂණ වෙළඳපොළ තුළ ඇති යම් පරතරයන් පියවාලීම සඳහා ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර.), රජයේ ප්‍රතිපාදන ලබන ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණයක් (ජා.ස්.ආ.ර.), ජාතික රක්ෂණ භාරකාර අරමුදල (ජා.ර.භා.අ.) හරහා හඳුන්වා දුන් අතර, 2016 අප්‍රේල් 1වැනි දින පටන් එය ක්‍රියාත්මක විය. වාසුළි, කුණාටු, චණ්ඩ මාරුත, ගංවතුර, නායයෑම්, සුළිසුළං, භූමිකම්පා, සුනාමි සහ වෙනත් ඕනෑම ස්වාභාවික උපද්‍රවයක් (නියඟ හැර) හේතුවෙන් සියළුම නිවාසවලට හා සුළු පරිමාණ කර්මාන්තවල දේපළ හා එහි අන්තර්ගතයන්ට සිදු වන හානි රු.මි.2.5ක් දක්වා (එක් සිද්ධියක් සඳහා), එනම් සියළුම ජීවිත හා දේපළ මෙම රක්ෂණයෙන් ආවරණය වේ.[13] කෙසේ වෙතත් සුළු ව්‍යාපාර අතරින් මෙම රක්ෂණයෙන් ආවරණය වන්නේ වාර්ෂික ආදායම් රු.මිලියන 10ට වඩා අඩුවෙන් උපයන ව්‍යාපාර පමණක් වන බැවින්, සුළු පරිමාණ ව්‍යාපාර අතරින් උප කාණ්ඩයකට පමණක් මෙම රක්ෂණාවරණය සීමා වේ.[14]

ජා.ස්.ආ.ර. යෝජනා ක්‍රමය වසර 2ක් තිස්සේ, මහා ගංවතුර අවස්ථා 2ක් (2016 මැයි හා 2017) තුළ ද පැවතියේ වුවත් එහි ප්‍රතිලාභීන්ට මෙම යෝජනා ක්‍රමය පිළිබඳ තිබුණේ ඉතා

# ප්‍රතිපත්ති සටහන

3 වන ප්‍රදර්ශිතය : ගිනි රක්ෂණ ඔප්පු ලේඛන ඉංග්‍රීසි, සිංහල හා දෙමළ බසින් ලබා ගැනීමට ඇති හැකියාව[15]




*මූලාශ්‍රය : ඉහත එක් එක් රක්ෂණ සමාගම්වල ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගත් දුරකථන ඇමතුම්*

*ෆෙයාෆස්ට් රක්ෂණ සමාගම යූනියන් ඇෂුවරන්ස් සාමාන්‍ය රක්ෂණ සමාගම සමඟ ඒකාබද්ධ විය. එබැවින් වාර්තා කර ඇති වෙළඳපළ පංගුව ශ්‍රී.ලං.ර.මණ්. හි 2016 වාර්තාවේ ඇති අගයන් එකතු කිරීමෙන් ලබා ගත්තකි.*

අඩු දැනුවත්භාවයකි. "මෙම යෝජනා ක්‍රමය පිළිබඳව පොදු ජනතාව තුළ ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොතිබුණේ" යැයි, 2017 මස ඇති වූ ගංවතුරෙන් පසු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පිළියෙළ කළ කඩිනම් පශ්චාත්-ආපදා අවශ්‍යතා තක්සේරුවේ දී හඳුනා ගැනිණි. ජා. ස්.ආ.ර. යටතේ වන්දි ලබා ගැනීමට සුදුසුකම් තිබූ සුළු ව්‍යාපාර බොහෝමයක් මෙවැනි යෝජනා ක්‍රමයක් ඇතැයි දැන නොසිටි බව, මාතර හා ගාල්ල ප්‍රදේශවල සු.ම.ක. පිළිබඳව වෙරිටේ සමීක්ෂණ ආයතනය මඟින් පැවැත්වූ සමීක්ෂණවල දී හෙළිදරව් විය.[16] කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල හා පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි අය 5,385 දෙනෙකු සාමාජිකයින් ලෙස සිටින ප්‍රජා පදනම් සංවිධානයක් වන ස්වෝපකාර සමූහ සම්පත් මධ්‍යස්ථානය (ස්ව.ස.ස.ම.) සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලින් මෙය තව දුරටත් තහවුරු විය. 2017 මැයි මස ඇති වූ ගංවතුරෙන් පසුව තම සාමාජිකයින්ට කෙතරම් හානි සිදු වී ඇත් දැයි තක්සේරු කර ගැනීමට ස්ව.ස.ස.ම. විසින් පුළුල් සමීක්ෂණයක් සිදු කළ අතර, හානියට පත් වූ එනම් උපකාර අවශ්‍ය වන සිල්ලර වෙළෙඳ සැල් 94ක්, ආහාර/රසකැවිලි නිෂ්පාදකයින් 452ක්, වෙළෙන්දන් 19 දෙනෙකු ඇති බව හඳුනා ගැනිනි. එහෙත් ජා. ස්.ආ.ර. ගැන ඔවුන් දැන නොසිටි බැවින් ඒ හරහා වන්දි හා උපකාර ලබා ගැනීමට යොමු වී නොතිබිණි.

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ තොරතුරු පද්ධතිය, හානි වූ ව්‍යාපාරවල අනුබණ්ඩනයක් ලබා නොදේ. 2017 මැයි ගංවතුරෙන් පසු සිදු කළ පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුවේ දී ද ගැටළුවක් ලෙස මෙය හඳුනාගෙන

4 වන ප්‍රදර්ශිතය : 2017 මැයි ගංවතුරේ දී ආපදාවට ලක් වූ පුද්ගලයින්ගේ ප්‍රතිශතය සමඟ වන්දි ඉල්ලුම්පත්‍ර බාර දුන් ක්ෂුද්‍ර හා සුළු ව්‍යාපාරවල ප්‍රතිශතය සංසන්දනය

| **2017 මැයි ගංවතුරෙන් වඩාත්ම හානියට පත් දිස්ත්‍රික්ක** | **ස්ථාපිත ව්‍යාපාර සංඛ්‍යාව (අවිධිමත් ක්ෂුද්‍ර, විධිමත් සුළු ව්‍යාපාර)** | (a) **සමස්ථ ස්ථාපිත ව්‍යාපාර අතරින් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව %ක් ලෙස**** | (b)**හානියට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව මුළු ජනගහනයේ %ක් ලෙස***** | **අනුපාතය** (b)/(a) |
|---|---|---|---|---|
| රත්නපුර | 41,439 | 9.6% | 21.6% | 2.25 |
| මාතර | 40,417 | 7.1% | 28.7% | 4.04 |
| ගාල්ල | 44,944 | 6.2% | 14.9% | 2.40 |
| කළුතර | 56,598 | 4.2% | 15.0% | 3.57 |
| හම්බන්තොට | 29,856 | 0.6% | 16.6% | 26.67 |

*2017 ගංවතුර හා නායයාම්, පශ්චාත් ආපදා කඩිනම් අවශ්‍යතා තක්සේරුවෙන් දත්ත උපුටා ගැනුණි.

**ගොඩනැගිලි හානි සහ තොගවලට සිදු වූ හානි වෙනුවෙන් සු.ම.ක. විසින් 1.1.2017 වන විට ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත් සංඛ්‍යාව පිළිබඳව ජා.ර.හා.අ. විසින් ලබා දුන් දත්ත පදනම් කර ගෙන ප්‍රතිශතය ගණනය කරන ලදී.

***2017 මැයි ගංවතුර හා නායයෑම්, පශ්චාත් ආපදා කඩිනම් අවශ්‍යතා තක්සේරුව සහ 2017 ජන හා නිවාස සංගණනයේ ජනගහණ දත්ත උපුටා ගනිමින් ප්‍රතිශතය ගණනය කෙරුණි.

## ප්‍රතිපත්ති සටහන

ඇත. කෙසේ වෙතත්, නියෝජනාත්මක දර්ශකයක් යොදා ගැනීමෙන් හානියට පත් වූ ව්‍යාපාර ගැන තක්සේරුවක් කළ හැකි වනු ඇත. එක් එක් දිස්ත්‍රික්කයේ හානියට ලක් වූ ජනගහන ප්‍රතිශතය, හානියට ලක් වූ ව්‍යාපාරවල ප්‍රතිශතයේ නියෝජනයක් ලෙස ගත හැකි ය.

2017 මැයි ගංවතුරෙන් හානියට පත් වූ (හානියට පත් වූ, මිය ගිය, තුවාල ලැබූ, අතුරුදහන් වූ) පුද්ගලයින් සංඛ්‍යාව ගැන දත්ත ජාතික ආපදා සහන මධ්‍යස්ථානය (ජා.ආ.ස.ම.) විසින් සම්පාදනය කරනු ලැබ, 2017 මැයි පශ්චාත් ආපදා කඩිනම් අවශ්‍යතා තක්සේරුව තුළ වාර්තා කර තිබේ. 2017 මැයි ගංවතුරේ දී, සෑම දිස්ත්‍රික්කයකම ආපදාවලට ලක් වූ පුද්ගලයින්ගේ ප්‍රතිශතය සමඟ වන්දි ඉල්ලුම්පත්‍ර බාර දුන් ක්ෂුද්‍ර හා සුළු ව්‍යාපාරවල ප්‍රතිශතය 4 වන ප්‍රදර්ශිතයෙන් සංසන්දනය කෙරේ.

හානියට ලක් වූ පුද්ගල ප්‍රතිශතය, වන්දි ඉල්ලුම් කළ ව්‍යාපාරවල ප්‍රතිශතයට වඩා බෙහෙවින් වැඩි ය. බොහෝ දිස්ත්‍රික්කවල, හානියට ලක් වූ පුද්ගලයින්ගේ ප්‍රතිශතය වන්දි ඉල්ලුම් කළ ව්‍යාපාරවල ප්‍රතිශතය මෙන් 2-4 ගුණයකි. මෙම අනුපාතය කිහිප ගුණයකින් ඉහළ යෑම විසින් කියා පාන්නේ, වන්දි ලබා ගැනීමට තිබූ පහසු ඉඩ ප්‍රස්ථා ගැන පැවති අඩු දැනුවත් මට්ටමයි.

මෙම ගැටළුව පිළිබඳ දැනුවත්භාවයක් නොමැතිකමට බොහෝ හේතු පැවතිය හැකි වූවත් මෙම යෝජනා ක්‍රමය ගැන තොරතුරු ස්වභාෂාවන්ගෙන් නොතිබීමක් පිළිබඳව මෙම පර්යේෂණයේ දී හඳුනා ගැනිණි ජා.ස්.ආ.ර. පිළිබඳව ජා.ර.භා.අ. වෙබ් අඩවියේ තොරතුරු 2017 වසරාවසානය තෙක් පැවතියේ ඉංග්‍රීසි බසින් පමණි 2017 නොවැම්බර් මස 13වන දින අවසන් වරට පරීක්ෂා කරනවිට ජා. ස්.ආ.ර. පිළිබඳ තොරතුරු ලබා දී තිබුණේ ඉංග්‍රීසි බසින් පමණි ජා. ස්.ආ.ර. ගැන තොරතුරු සිංහල බසින් ද සඳහන් වන පරිදි මෙම වසර මුල දී වෙබ් අඩවිය යාවත් කාලීන කර තිබුණ ද, ජා. ස්.ආ.ර. ගැන තොරතුරු දෙමළ බසින් ද සඳහන් වන ලෙසින් එම යාවත්කාලීන කර නොතිබුණි. (1 වන ඇමිණුම)

### 4. බැංකු ක්ෂේත්‍රයේ දක්නට ඇති භාෂා නියාමනයන් රක්ෂණ ක්ෂේත්‍රය තුළ තවමත් පෙන්නුම් කර නොමැත

රක්ෂණ ලේඛන සැපයිය යුතු භාෂාවන් නිශ්චිතව නියම කර ඇති නීති හෝ නියමයන් හා රෙගුලාසි දැනට නොපවතී.[17] කෙසේ වුව ද, ගනුදෙනුකරුවන්ට තේරුම් ගත හැකි භාෂාවෙන් රක්ෂණ ලේඛන ලබා දීම නීතියෙන් අනිවාර්ය කිරීමෙන්, ආපදා අවදානම් රක්ෂණය වෙත ප්‍රවේශවීමට ඇති භාෂාමය බාධකය තුරන් කිරීමට හැකි වන අතර, එය රක්ෂණ කර්මාන්තය කෙරෙහි ඇති සු.ම.ක.වල විශ්වාසය ඉහළ නැංවීමෙහි ලා තිබෙන වැදගත් පියවරක් වනු ඇත.

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය මෙම අවශ්‍යතාවය දැනටමත් හඳුනාගෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා චර්යා සංග්‍රහයක් හඳුන්වා දී ඇත. එහි දැක්වෙන අනෙකුත් පූර්ව අවශ්‍යතා අතර, බැංකු නිෂ්පාදිතයන්වල නියමයන් හා කොන්දේසි ගනුදෙනුකරුවන්ට තේරුම් ගත හැකි භාෂාවෙන් සැපයිය යුතු යැයි නියම කර තිබේ.[18] (විස්තර සඳහා 1 වන කොටුව බලන්න)

මෙම ප්‍රතිපත්ති සංශෝධනය සිදු කිරීමේ කාර්ය, ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට (ශ්‍රී.ල.ර.ම.) පැවරිය හැකි ය. ශ්‍රී.ල.ර.ම. පාලනය වන්නේ, 2007 අංක 27 දරණ පනත හා 2011 අංක 3 දරණ පනත මඟින් සංශෝධිත, 2000 අංක 43 දරණ

1 වන කොටුව බලපත්‍රලාභී බැංකු සඳහා වන චර්යා සංග්‍රහය තුළ ඇති භාෂා නියමයන්

2006 අංක 46 දරණ බැංකු පනත මඟින් අවසන් වරට සංශෝධනය කළ 1988 අංක 30 දරණ බැංකු පනත, බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර කටයුතුවල ඕනෑම අංශයක කටයුතු සිදු කළයුතු ආකාරය සම්බන්ධයෙන් විධානයන් පැනවීමේ බලය මුදල් මණ්ඩලයට පවරා ඇත. ගනුදෙනුකරුවන්ගේ අභිරුචීන් ආරක්ෂා කිරීමේ ද, ගනුදෙනුකරුවන් හා බැංකු අතර හිතකර සබඳතාවයක් ගොඩ නැඟීමේ ද එමෙන්ම බැංකු ක්ෂේත්‍රය තුළ ගනුදෙනුකාර ස්ථායිතාවය සහතික කර ගැනීමේ ද අරමුණු පෙරදැරිව, සියළු බලපත්‍රලාභී බැංකු විසින් අනුගත කර ගත යුතු චර්යා පද්ධතියක් නියම කෙරෙන ගනුදෙනුකාර ප්‍රඥප්තියක් 2011 අංක 8 දරණ විධානය මඟින් නිකුත් කර තිබේ.

බැංකු සපයන නිෂ්පාදිතයන් හා සේවාවන්හි, නියමයන් හා කොන්දේසි ඉදිරිපත් කළ යුතු අන්දම ගනුදෙනුකාර ප්‍රඥප්තිය මඟින් නියම කෙරේ. ඊට අනුකූලව, බැංකු වෙතින් ලබා ගන්නා ඕනෑම එක් එක් නිෂ්පාදිතයක් හෝ සේවාවක් හා සබැඳි නියමයන් හා කොන්දේසි වෙත ප්‍රවේශ වීමේ හා පරිපූර්ණ ලෙස අවබෝධ කර ගැනීමේ අයිතිය ගනුදෙනුකරුවන් සතු වේ. ඒ අනුව, බැංකු සපයන සෑම නිෂ්පාදිතයක් හෝ සේවාවක් හා සබැඳි "නියමයන් හා කොන්දේසි", ගනුදෙනුකරුවන්ට තේරුම් ගත හැකි භාෂාවෙන් (වඩා රුචි) ලබා ගත හැකි පරිදි තිබීම, බලපත්‍රලාභී බැංකු විසින් සහතික කර ගත යුතු ය.

බැංකු හා රක්ෂණ යන කර්මාන්ත දෙකම අයත් වන්නේ මූල්‍ය ක්ෂේත්‍රයට වන අතර ඔවුන් ගනුදෙනුකරුවන් හා කටයුතු කරන්නේ ගිවිසුම්කාර පදනමකිනි. බැංකු කර්මාන්තයේ නිදර්ශනය ඇසුරු කර ගනිමින්, රක්ෂණ කර්මාන්තය ද එවැනිම භාවිතාවක් කෙරෙහි අනුගත වුවහොත් ගනුදෙනුකරුවන් නොමඟ යාමෙන් වැලකී, රක්ෂණ කර්මාන්තය කෙරෙහි පොදු ජනතාවගේ හා සු.ම.ක.වල ඇති විශ්වාසය වැඩි දියුණු වීමට එය උපකාරී වනු ඇත.

## ප්‍රතිපත්ති සටහන

රක්ෂණ කර්මාන්ත නියාමන (ර.ක.නි.) පනත මඟිනි.[19] ර.ක.නි. පනතට අනුව, රක්ෂණ හිමියන් හා විභව්‍ය රක්ෂණ හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ වගකීම ශ්‍රී.ල.ර.ම. සතු වේ. තව ද, රක්ෂණ හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමේ අරමුණ සහිතව රක්ෂණකරුවන්, තැරැව්කරුවන් හා හානි අනාකූලකරුවන් වෙත නියෝගයන් නිකුත් කිරීමට ද පනත මඟින් ශ්‍රී.ල.ර.ම.ට බලය පවරා තිබේ. රක්ෂණ හිමියන්ට රක්ෂණ ලේඛන අප්‍රමාදව ලබා දීමට නියම කිරීම, රක්ෂණ දැන්වීම් ර.ක.නි. පනතට අනුකූල වන බවට වග බලා ගැනීම හා රක්ෂණ වන්දි ඉල්ලීම් ගෙවීමේ කාලසීමාවන් නියම කිරීම වැනි විධානයන් නිකුත් කිරීම තුළින් රක්ෂණ හිමියන්ගේ අයිතීන් ආරක්ෂාකර ගැනීම සඳහා මීට පෙර දී, ශ්‍රී.ල.ර.ම. විසින් පියවර ගෙන තිබේ.

මෙම අධ්‍යයනය වෙරිටේ රිසර්ච් හි ආර්ථික පර්යේෂණ කණ්ඩායම විසින් සම්පාදනය කරන ලදී. සචින්තා ප්‍රනාන්දු මෙම ප්‍රතිපත්ති සාරාංශය රචනා කළ අතර, එයට පර්යේෂණ සහාය විනුර ජයසේකර ද සංස්කරණ සහාය වෙන්යා ද සිල්වා ද ලබා දෙන ලදි. සමස්ත පර්යේෂණ හා සංස්කරණ අධීක්ෂණය සුභාෂිනි අබේසිංහ සහ නිෂාන් ද මෙල් විසින් ලබා දෙන ලදී. රත්නපුර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් සබරගමුව වාණිජ මණ්ඩලයට ද, ස්වකීය අන්තර්ඥානයන් හා සහයෝගයන් ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයට හා පහත සඳහන් ප්‍රාදේශීය වාණිජ මණ්ඩලවලට ද මෙම කණ්ඩායම සිය ස්තුතිය පළ කරයි; මධ්‍යම පළාත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, ගාල්ල දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, ත්‍රිකුණාමල දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, යාපනය වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, මඩකලපු දිස්ත්‍රික් වාණිජ කර්මාන්ත හා කෘෂි මණ්ඩලය, සබරගමුව වාණිජ මණ්ඩලය, අම්පාර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, දිස්ත්‍රික් වාණිජ කර්මාන්ත හා කෘෂි මණ්ඩලය, හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය, මාතර දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය සහ වයඹ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

## Endnotes

1 The Constitution of the Democratic Socialist Republic of Sri Lanka, available at :http://www.parliament.lk/files/pdf/constitution.pdf, [accessed on: December 2017].

2 Insurance Board of Sri Lanka, 'Statistical Review 2016', 2016, available at: http://www.ibsl.gov.lk/images/IBSL-AR%202016-Inner-21-59.pdf, [accessed on: November 2017].

3 Swiss Re, Sigma No3/2016, 'World Insurance in 2015 – Steady growth amidst regional disparities', (2016), available a:t http://media.swissre.com/documents/sigma_3_2016_en.pdf, [accessed on: December 2017].

4 Ibid.

5 Secretariat for Senior Ministers, 'The National Human Resources and Employment Strategy for Sri Lanka', 2012, available at: http://www.nhrep.gov.lk/images/pdf/nhrep_final.pdf, [accessed on: January 2017].

6 Ministry of Industry of Commerce, 'SME – National Policy Framework for Small and Medium Scale Enterprise Development', available at: http://www.industry.gov.lk/web/images/pdf/framew_eng.pdf, [accessed on: January 2017].

7 Disaster Management Center, Ministry of Disaster Management, 'Sri Lankan National Disaster Management Plan 2013-2017', 2014

8 Insurance Board of Sri Lanka, 'Statistical Review 2016', 2016,available at: http://www.ibsl.gov.lk/images/IBSL-AR%202016-Inner-21-59.pdf, [accessed on: November 2017].

9 Op cit., Swiss Re.

10 Ibid.

11 Census of population and housing in Sri Lanka 2012, available at:http://www.statistics.gov.lk/PopHouSat/CPH2011/index.php?fileName=FinalPopulation&gp=Activities&tpl=3, [accessed on: January 2018]

12 Focus group discussions with SMEs from the Ratnapura district who were affected by the May 2017 floods. The discussions were arranged by the Sabaragamuwa Chamber of Commerce. The focus group consisted of 10 SMEs.

13 National Insurance Trust Fund, available at: http://www.nitf.lk/ENGLISH/National%20Natural%20Disaster.html, [accessed on: November 2017]

14 As per the SME National Policy Framework for Small and Medium Scale Enterprise Development (http://www. industry. gov.lk/web/images/pdf/framew_eng.pdf) SMEs are categorised as follows: Micro Enterprises are enterprises that earn less than LKR 15 million annual revenue; Small Enterprises are enterprises that earn an annual revenue of LKR 16 million – LKR 250 million; Medium Enterprises are enterprises that earn an annual revenue of LKR 251million – 750 million.

15 Op cit., Insurance Board of Sri Lanka.

16 Four SMEs were surveyed from the Galle district and three SMEs from the Matara district who were affected by the 2017 May floods.

17 Information obtained from an application to receive information under the Right to Information Act No.12 of 2016 submitted to the Insurance Board of Sri Lanka on 4th October 2017 requesting "All documents containing information on rules relating to the language which must be used in drafting insurance related documents in Sri Lanka". The reply was received on 10th October 2017 stating "No rules or any related documents have been issued by the Insurance Board of Sri Lanka on specifying language to be used in drafting insurance related documents".


18 Monetary Board of Central Bank of Sri Lanka, 'Banking Act Direction No.8 of 2011 – Customer Charter of Licensed Banks', 2011, available at:http://www.cbsl.gov.lk/pics_n_docs/09_lr/_docs/directions/bsd/BSD_2013/bsd_LCB_Up_to_30_Nov_2013.pdf, [accessed on: January 2018].

19 Regulation of Insurance Industry Act, No.43 of 2000 as amended by Act, No. 27 of 2007 and Act, No. 03 of 2011, available at: http://www.ibsl.gov.lk/images/RII-Act-No-43-of-2000.pdf, [accessed on: January 2017].

## 1 වන ඇමිණුම – 13.11.2017. දින ජා.ර.භා.අ. වෙබ් අඩවියෙන් ලබා ගත් පරිගණක තිර රූප


### ඉංග්‍රීසි වෙබ් අඩවිය




### සිංහල වෙබ් අඩවිය



### දෙමළ වෙබ් අඩවිය






## ප්‍රතිපත්ති සටහන

### 2 වන ඇමිණුම : ශ්‍රී.ලං.ර.ම. වෙතින් ලද තො.දැ.අ. ප්‍රතිචාරය

IBSL
INSURANCE BOARD OF SRI LANKA

**INSURANCE BOARD OF SRI LANKA**
(Established under Act No. 43 of 2000)

Level 11, East Tower, World Trade Centre, Echelon Square, Colombo 1.
Tel: General : +94 11 2396184-9, Fax: +94 11 2396190 Website: www.ibsl.gov.lk

**BY REGISTERED POST/FAX** **Ref: IBSL/LEG/17/10/249**

10th October 2017

[redacted]
(Off Police Park Avenue),
Colombo 05.

Dear Madam,

**Application to receive information under the Right to Information Act, No. 12 of 2016**

We refer to your letter dated 04th October 2017, on the above.

Responses to your application are listed below:

1. No Guidelines or any related documents have been issued by Insurance Board of Sri Lanka (IBSL) on drafting insurance proposals. However, Guidelines on Linked long term business dated 01-05-2007 and the amended Guidelines made thereto dated 15-03-2016 and 21-10-2016 can be downloaded from IBSL website from the following link:

   "http://www.ibsl.gov.lk/instructions-and-guidelines/guidelines.html"

2. No Rules or any related documents have been issued by IBSL on specifying language to be used in drafting insurance related documents in Sri Lanka;

3. No Rules or any related documents have been issued by IBSL on setting limits for insurance proposals;

4. A List of all licensed insurance companies in Sri Lanka and their contact details can be downloaded from IBSL website from the following link. However, the branches of such companies which operate in Kandy has to be checked from such companies on an individual basis:

   "http://www.ibsl.gov.lk/insurance-companies.html"

5. Any Rules, Regulations, Orders, Determinations, Terms and Conditions made by IBSL can be downloaded from IBSL website from the following link:

   "http://www.ibsl.gov.lk/insurance-legislation.html"

Yours faithfully,

Ranil Angunawela
**Director Legal**